## උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන නිලධාරී තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවැත්වීමට නියමිත විවෘත තරග විභාගය -2021

උතුරු පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන නිලධාරී **III වන** ශ්‍රේණියේ තනතුරට පවතින පුරප්පාඩු සංඛ්‍යා 22 ක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය *31.03.2021*වේ.

**02 බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-**

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද සමූපකාර සංවර්ධන නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය, බඳවා ගැනීමේ කාර්ය පටිපාටියේ නිර්දේශිත කොන්දේසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක1817/30දරණ2013.07.03වන දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් පළ කිරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන කාර්ය පටිපාටීන් යනාදීන්ට යටත්ව, තෝරා ගනු ලබන විභාග අපේක්ෂකයන් උක්ත තනතුරේ **III වන** ශ්‍රේණියට පත්කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත්වී සම්මුඛ පරීක්ෂණයට තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර තුනකට පරිවාස කාලයට යටත් කොට **III වන** ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි.සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි සමූපකාර සංවර්ධන නිලධාරී සේවයේ **III වන** ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර තුනක (03) කාලයක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.3 සමූපකාර සංවර්ධන නිලධාරී තනතුරට අදාළ පත්වීම් ලබන නිලධාරියා පරිවාස කාලය වන අවුරුදු 03 ක කාලයක් තුළ එක් වසරකට නොඅඩු හා පැය 500 ක් වූ සමූපකාර සංවර්ධන කටයුතු සම්බන්ධ පූර්ණ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කළ යුතු වේ.

02.4 මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වන සේවයක් වන අතර මෙම සේවයට පත්වන්නාවූ අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුයි. එමෙන් ම මෙම කොන්දේසියට යටත් විය යුතුයි.

02.5 පත්වීම් සංඛ්‍යාව හා එය ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. නිවේදනය කර ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුවන අතර පත් කිරීමට නියමිත සංඛ්‍යාව **22** කි.

**03 වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි,වැටුප් කාණ්ඩය**MN 3 - 2016**පරිදි සමූපකාර සංවර්ධන නිලධාරී III වනශ්‍රේණියේ තනතුරට අදාළ ඒකාබද්ධ වැටුප් අනුපාතයරු. **31,040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57,550/-**ක් වේ. (රුපියල් 31,930කවැටුප් පියවරට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුයි)

**04 සාමාන්‍ය සුදුසුකම් :-**

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය වන පරිදි ශාරීරික වශයෙන් නිරෝගී පුද්ගලයන් විය යුතු අතර මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුයි.

04.3 අ) අයදුම්කරු උතුර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. මෙම අයදුම්පත කැඳවීමේ අවසාන දිනට ප්‍රථම ඇති වසර හයක (06) කාලපරිච්ඡේදය තුළ අවම වශයෙන් වසර තුනක්වත්(03) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**හෝ**

ආ) අයදුම්කරුවන් හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතුයි එමෙන්ම අවම අවුරුදු පහක්(05) අදාළ පළාතේ අඛණ්ඩව පදිංචිවී සිටි අය විය යුතුයි(***සම්මුඛ පරීක්ෂණයේ දී තම ඡන්ද නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුයි**)

04.4 අයදුම්කරුගේ වයස අයදුම්පත භාරගන්නා අවසාන දිනට අවුරුදු *18*ට **නොඅඩු හා අවුරුදු 30** ට නොවැඩි විය යුතුයි.

04.5 අයදුම්පත භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවන ලද **සියළුම සුදුසුකම්** අපේක්ෂකයා විසින් සපුරා තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්:-

**05.1** අපොස (සා/පෙ)විභාගයෙන්එකවර **භාෂාව**(දෙමළ/සිංහල),ගණිතය/ගණිතයයන විෂයයන් ඇතුළුව විෂයයන් **හතරකට** (04)සම්මාන සමාර්ථයන් සහිතව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමගම**

අ.පො.ස (උ/පෙ) විභාගයෙන්**එකවර**ආර්ථික විද්‍යාව,කෘෂිකර්මය,සංයුක්ත ගණිතය,ගිණුම්කරණය,ව්‍යාපාර සංඛ්‍යාන හා ව්‍යාපාර අධ්‍යාපනය යන විෂයයන් ගෙන් එක් විෂයක් අන්තර්ගතව විෂයයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබිය යුතුයි. (පරණ විෂය නිර්දේශය නම් එකවර විෂයයන් තුනක්(03) සමත්වී තිබිය යුතුයි)

**05.2** **වෘත්තීය සුදුසුකම් :-**

අයදුම්කරුවන් පොල්ගොල්ල ප්‍රදේශයේ පිහිටි,සමූපකාර සංවර්ධන ජාතික ආයතනය විසින් පවත්වනු ලබන ඉහළ ගණකාධිකරණය(Higher Accountancy)/විගණනය(Auditing) /කළමනාකරණය(Management) යන පාඨමාලවන්ගෙන් එකකට ඩිප්ලෝමා හෝ උතුරු පළාත් සමූපකාර පුහුණු මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන සමූපකාර සංවර්ධනය සම්බන්ධ උසස් මට්ටමේ පාඨමාලාවක් හදාරා සමත්වී තිබිය යුතුයි.

**හෝ**

අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගිණුම්කරණ තාක්ෂණශිල්පීය ආයතනයේ(Assosiation of Accounting Technician – AAT) අවසන් මට්ටමින් සමත්වී තිබිය යුතුයි.

**හෝ**

අනුමත විශ්ව විද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් අභ්‍යන්තර අධ්‍යාපන ආයතන හෝ රට අභ්‍යන්තරව පවත්වාගෙන යනු ලබන විදේශීය අධ්‍යාපන ආයතනයකින් ගිණුම්කරණය හෝ කළමනාකරණ විෂයට ඩිප්ලෝමා හිමිකර තිබිය යුතුයි.

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙන් පවත්වනු ලබ වරලත් ගණකාධිකාරී පරීක්ෂණයෙන් (Chartered Accountancy Examination)අතරමැදි ශ්‍රේණියට(Intermidiate)සමත්වී තිබිය යුතුයි.

**හෝ**

ජාතික උසස් වෘත්තීය විද්‍යායතනයෙන් අවුරුද 04 ක ගිණුම්කරණ ඩිප්ලෝමා සහතික ලබා තිබිය යුතුයි.

**හෝ**

ජාතික උසස් වෘත්තීය විද්‍යායතනයෙන් ව්‍යාපාර පරිපාලනය සම්බන්ධයෙන් අවුරුදු තුනක උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුයි.

## 06 බඳවා ගැනීමේ පටිපාටින් :-

**06.1** ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් පළාත් මට්ටමින් ඉහළ ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලබන අවස්ථාවේ ක්‍රියාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ,බඳවා ගැනීමේ පටිපාටින්,ජාතික හා පළාත් ප්‍රතිපත්ති යනාදීන්ට යටත්වබඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා ලකුණු ප්‍රදානය නොකරන අතර අවශ්‍ය සුදුසුකම් නැති බවට අනාවරණය වන විට මෙම තනතුරු සඳහා ඇති හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ.

**06.2** ඉහත පරිදි සුදුසුකම් සියල්ල සපුරා ඇති අයදුම්කරුවන්,ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයන් ලබා ගන්නා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සඳහා පත්වීමට තෝරා ගනු ලැබේ.

**06.3** පුරප්පාඩුවලින් 03%ක් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් සඳහා (ආබාධිත) වෙන්කරනු ලැබේ. අදාළ අපේක්ෂකයා පත්වීම සඳහා තෝරා ගන්නා විට එම තනතුරේ සේවය කිරීමට තම විශේෂිත අවශ්‍යතා තත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තා මගින් ඔප්පු කළ යුතුයි.

## 07. විභාග ගාස්තු:-

අපේක්ෂකයන් පදිංචි වී සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීයලේකම් කාර්යාලයක රුපියල් 500.00 ක් ගෙවා **"ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු පළාත"** ගේ**"3401"**යන ගිණුමට මුදල් ගෙවූ කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා එවිය යුතුයි. මොනම හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවීම් නොකරන අතර මෙම ගාස්තුව වෙනත් කිසියම විභාගයක් සඳහා මාරු කිරීමටද අවසර දෙනු නොලැබේ

**08. අයදුම්කරන ක්‍රමය :-**

08 මෙම දැනවීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලවA4ප්‍රමාණයේ (21 සෙ.මී x 29 සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා තිබෙන ඡේද පළමු පිටුවේ ද,ඉතිරි කොටස් අනෙක් පිටුවේ ද ආවරණය වන පරිදි අයදුම්පත සකස් කර ගත යුතුයි.සම්පූර්ණ කරන ලද අයදුම්පත31.03.2019වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි,**"ලේකම්,පළාත් රාජ්‍ය සේවාකොමිෂන් සභාව,උතුරු පළාත,අංක: 393/48,කෝවිල් වීදිය,නල්ලූර්,යාපනය"**යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් යොමු කළ යුතුයි.

08.1 අයදුම්පත්‍රය/අයදුම්පත්‍ර යොමු කරන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ " **සමූපකාර සංවර්ධන නිලධාරී තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම - 2021**"යනුවෙන් සඳහන් කළ යුතුයි

08.2 අයදුම්පතේ ඡායා පිටපත ඔබ බාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. විභාගය ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.

08.3 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුමකරුවන්ටවිභාගය පැවැත්වීමට නියමිත දින තුනකට (03) ප්‍රථමප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්,ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමඟ**"ලේකම්,පළාත් රාජ්‍ය සේවාකොමිෂන් සභාව,උතුරු පළාත,අංක: 393/48,කෝවිල් වීදිය,නල්ලූර්,යාපනය"**යන ලිපිනයටදැන්වීමට කටයුතු කළ යුතුයි.(දුරකථන අංකය - 021 221 9939,ෆැක්ස් අංක- 021 221 9940)

**ඉදිරිපතත් කළ යුතු තොරතුරු:-**
තොරතුරු ඇතුළත් ලිපියක්,අයදුම්පතේ පිටපතක් හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත,ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්

**09.අනන්‍යතාවය තහවුරු කිරීම:-**

විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයන්ටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම් පත

(ii) වලංගු විදේශ ගමන්බලපත්‍රය.

(iii) රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකමලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු පළාත,ගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

**10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම :-**

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතා අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග නීතිරීති පරදී කිසියම් අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ කුමණ අවස්ථාවක හෝ වුවද සුදුසුකම් සපුරා නැති බව අනාවරණ වන්නේ නම්,එසේ අනාවරණය වූ අවස්ථාවෙම අපේක්ෂකත්වය සඳහා ඇති හිමිකම් සියල්ල අවලංගු කරනු ලැබේ. එමෙන්ම සපයා ඇති තොරතුරු අසත්‍ය බව අනාවරණ වන විට පළාත් රාජ්‍ය සේවයෙන් ද නෙරපා හැරීමට කටයුතු කරනු ලැබේ.

**11. අත්සන සහතික කිරීම :-**

**අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ.** රජයේ ආයතනයක් මඟින් අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධරයකු මඟින් තම අත්සන සහතික කරවා ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීසාම විනිසුරු,දිවුරුම් නිලධාරි,නීතිඥවරයකු,නොතාරිස්,නාවික හමුදා,යුද හමුදා,ගුවන් හමුදාවන්හි සේවයේ නියුතු නියෝගලත් නිලධාරියකු,රුපියල්498,960.00 ට නොඅඩු වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු,ආගමික නිකායන් භාරව කටයුතු කරන පූජක පක්ෂයේ පූජකයකු විසින් සහතික කළ යුතුයි.

**12.විභාගය පරිපාටිය :-**

මෙම විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර දෙමළ භාෂා මාධ්‍ය මඟින් පැවැත්වේ. එසේම සුදුසුකම් සපුරා ඇති සිංහල භාෂා මාධ්‍ය මඟින් වූ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර යොමු වී ඇති විටෙක මෙම විභාගය සිංහල භාෂා මාධ්‍යයෙන් ද පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කළ නොහැකිය.

| අංක | විෂයය | විෂයයට අදාල කරුණු | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| *01* | පොදු අභියෝග්‍යතාවය | තර්කානුකුල හැකියාව,විශ්ලේෂණ හැකියාව සමඟ තීරණය කිරීමේ හැකියාව යන කරුණු ඇතුළත් බහුවරණ ප්‍රශ්න 50 ක් හා කෙටි ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයක් වන අතර විභාග අපේක්ෂකයන්ගේ හැකියාවන් උරගා බැලීම සඳහන් සකස් කරන ලද්දක් වේ. | පැය01 | *100* |
| *02* | සාමාන්‍ය දැනුම | ජාතික හා ජාත්‍යාන්තර මට්ටමින් වූ දේශපාලනය,සමාජීය,ආර්ථික හා සංස්කෘතිකය හා සබැඳි විෂයයන් ගැන හා සමූපකාර දර්ශනය,ව්‍යාපාර සම්බන්ධ බහුවරණ හා කෙටි ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයක් වන අතර විභාග අපේක්ෂකයන්ගේ හැකියාවන් උරගා බැලීම සඳහන් සකස් කරන ලද්දක් වේ. | පැය01 | *100* |

මෙම විභාගය තරග විභාගයක් වන බැවින් අපේක්ෂකයෙක් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට නම් වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් **සියයට හතලිහක් (40%)**ලබා ගත යුතුයි මෙම තරග විභාගය මඟින් ලබා ගන්නා සම්පූර්ණ ලකුණු අනුපිළිවෙළ(Provincial merit order) සැළකිල්ලට ගනු ලැබේ.

**13. විභාග ප්‍රතිඵල :-**

අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lkයන උතුරු පළාත් වෙබ් අඩවිය මඟින් නිකුත් කරනු ලැබේ. අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයන්ටම තැපැල් මඟින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

**14.** විභාගය පැවැත්වීමට නියමිත විභාග නගර හා නගර අංකයන් පහත සඳහන් වේ,

| *නගර* | *නගර අංක* |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලයිතීව් | 05 |

එක් විභාග මධ්‍යස්ථානයක් සඳහා ලැබෙන අයදුම්පත්වල ගණන අඩුවේ නම් ළඟම ඇති විභාග නගරයට එම මධ්‍යස්ථානය මාරු කිරීමට අවස්ථාව ඇත.

*15.* මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතුය. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකුලතාවයක් ඇති බව පෙනී යන අවස්ථාවකදී දෙමළ මාධ්‍යයේ නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

S.තිරුවාකරන්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.
*15.03.2021*